සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන
විවෘත තරග විභාගය - 2009 (2010)

## (02) රචනය හා සාරාංශය

ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න. (පැ. දෙකයි)

---

1. පහත සඳහන් මාතෘකා අතුරෙන් **එකක්** තෝරාගෙන විශ්ලේෂණාත්මකව හා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් වචන සංඛ්‍යාව 250 – 300 අතර වනසේ රචනාවක් ලියන්න.
   - (i) පොදු ජන ආකල්ප හඳුනා ගනිමින් සංවේදී ව හා නිහතමානී ව තම රටට ජාතියට සේවය කිරීම රාජ්‍ය සේවකයාගේ යුතුකම විය යුතු ය.
   - (ii) ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය උදෙසා ඉංග්‍රීසි භාෂා මාධ්‍යය යොදා ගැනීම හා එහි ප්‍රතිවිපාක
   - (iii) දේශීය ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සම්පාදනය, සහනාධාර සැපයීමට වඩා ප්‍රතිඵලදායක වේ.
   - (iv) රටක තිරසාර සංවර්ධනයට හිතකර වන්නේ ශ්‍රම වෙළෙඳපොළේ අවශ්‍යතාවලට යෝග්‍ය අධ්‍යාපන ක්‍රමයකි.
   - (v) ත්‍රස්තවාදය තුරන් කිරීම සඳහා ලෝක බලවතුන් අනුගමනය කරන උපාය මාර්ගවල සාර්ථකත්වය හා සාධාරණත්වය
   - (vi) බහුවාර්ගික හා බහුභාෂක සමාජයක පවතින ගැටලු නිරාකරණයේ දී උපයෝගී කොට ගත හැකි ක්‍රියා මාර්ග

2. පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** පමණ වනසේ සාරාංශ කොට ලියා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. (සාරාංශය අවසානයේ ඔබ යෙදූ වචන ගණන ද ලියන්න.)

පසුගිය කාලය තුළ දී සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල විදේශ විනිමය ගලා ඒම්වල ප්‍රධාන ප්‍රවාහයක් වූයේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණයි. එය විදේශීය සෘජු ආයෝජකයන්ගෙන් පසු සංවර්ධනය වෙමින් පවතින රටවල දෙවන විශාලතම බාහිර මූල්‍යකරණ මූලාශ්‍රය බවට පත්වී ඇත. එය රටට ලැබෙන නිල ආධාර මෙන් දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකි.

දශ ලක්ෂයකට වැඩි ශ්‍රී ලාංකිකයන් පිරිසක් රැකියා සඳහා විදේශගතව ඇති අතර මින් වැඩි ම පිරිසක් මැද පෙරදිග රටවලට සංක්‍රමණය වූවෝ වෙති. රජයට ලැබෙන විදේශ මූල්‍ය ලැබීම්වලට වඩා විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ඉහළ වන අතර පුළුල් වෙමින් පවතින වෙළෙඳ පරතරය මූල්‍යනය කිරීමේ ප්‍රධාන මූලාශ්‍රයක් බවට ද එය පත්වී ඇත. කෙසේ වෙතත් විදේශ ලැබීම්වල දී අපනයන ඉපැයුම් විශේෂයෙන් රෙදිපිළි හා නිමි ඇඳුම් ප්‍රමුඛ මූලාශ්‍රය බවට පත්වී ඇතත්, ඉන්පසු වැදගත් අංශයක් වී ඇත්තේ මෙම ප්‍රේෂණ සහ සේවා අපනයනයන්ගෙන් ලැබුණු ඉපැයුම් වේ.

මෙම ප්‍රේෂණ මඟින් විදේශ විනිමය හිඟය සහ විනිමය අනුපාතිකය මත වන පීඩනය ලිහිල් කිරීමටත් ගෙවුම් ශේෂ තත්ත්වය වැඩි දියුණු කිරීමටත් උපකාරී වේ. ප්‍රේෂණ මඟින් රටේ ණය ලබා ගත හැකි හැකියාව සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා වන ප්‍රවේශයත් ඉහළ නංවනු ඇත. ආර්ථික චක්‍ර අනුව ආර්ථිකය වර්ධනය වන අවස්ථාවල දී ප්‍රාග්ධනය ගලාඒම ඉහළ යන අතර ආර්ථික වර්ධනය පහත වැටෙන අවස්ථාවල දී පහත බසිනු ඇත. එහෙත් විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ එම රටවල ආර්ථික වර්ධනයන් පහත වැටෙන අවස්ථාවල දී පවා ඉහළ යාමේ නැඹුරුවක් පෙන්නුම් කරන්නේ ය. මෙම ප්‍රේෂණ ගෙවුම් තුලනයේ උච්චාවචනයන් සමනය කිරීමට උපකාරී වේ. මෙම ප්‍රේෂණ සංවර්ධනය වෙමින් පවතින රටවල අනෙකුත් විදේශ විනිමය මූලාශ්‍රවලට සාපේක්ෂකව අඩුවෙන් උච්චාවචනය වන තත්ත්වයක් පෙන්නුම් කර ඇත. එමෙන්ම මෙම ගලාඒම් වඩාත් සාධාරණ ආදායම් ව්‍යාප්තියක් සඳහා උපකාරී වේ.

සංක්‍රමිකයන්ගෙන් ලැබෙන මෙම ප්‍රේෂණ ප්‍රයෝජනවත් වුව ද ඒ හා සම්බන්ධ පිරිවැය රාශියක් ඇත. ඒ අතරින් විශාලතම වන්නේ තාවකාලිකව හෝ පවුල් වියවුල් වීමෙන් වන සමාජ පිරිවැය වේ. එමෙන්ම තාවකාලික වශයෙන් වුව ද බුද්ධිගලනය සහ පුහුණු ශ්‍රමය ගලායෑම නිසා ආර්ථික වර්ධනයට අහිතකර බලපෑම් ඇති වේ. සමහර පුහුණු ශ්‍රමිකයින් විදේශ රටවලින් ඉල්ලුම් කිරීම නිසා ශ්‍රමය අපනයනය වන රටවල හිඟයක් ඇති විය හැකි ය. මුළු විදේශීය සංක්‍රමිකයන්ගෙන් සියයට 70 කට වඩා වැඩි ප්‍රමාණයක් ගෘහසේවිකාවන් සහ නුපුහුණු පුද්ගලයන් වන අතර පුහුණු ශ්‍රමික කාණ්ඩය සියයට 20 ක් පමණ වේ.

***

EXAMMOOD.LK